## 13 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය - 6 වන සතිය - ජූනි 8 සිට 12 දක්වා

## ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා තොරතුරු පද්ධති දායක කර ගන්නා ආකාරය

## 17.1 දත්ත සකස් කිරීම විමසමින් තොරතුරු වර්ග කරයි.

දත්ත කිසියම් ක්‍රමවේදයකට අනුව සකස් කර නොමැති නිසා ඒවා පදනම් කොට ගෙන සෘජුවම තීරණ ගත නොහැකි අතර තොරතුරු කිසියම් ක්‍රමවේදයකට අනුව සකසා ඇති නිසා ඒවා තීරණ ගැනීමේදී භාවිතයට ගත හැකිය.

දත්ත රූපමය,සංඛ්‍යාමය,ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය.

දත්ත හා තොරතුරු අතර වෙනස්කම් කිහිපයකි.දත්ත,සැකසුම් ක්‍රියාවලිය මගින් තොරතුරු බවට පරිවර්තනය කළ හැකි අතර වර්ගීකරණය,තේරීම,ගණනය කිරීම,සාරාංශගතකරණය ආදී ලෙස සැකසුම් ක්‍රියාවලියේ කාර්ය කීපයකි.

එසේම දත්ත සැකසීමේ තාක්ෂණයේද වර්ග 4ක් දැකිය හැකි අතර ඒ සඳහා විවිධ උපකරණද යොදා ගනී.

විස්තරාත්මක බව,නම්‍යශීලී බව,ලබා ගැනීමේ පහසුව,සංසන්දනය කළ හැකි බව,අවබෝධ කරගත හැකිබව,විශ්වාසදායක බව,නිවැරදි බව,කාලීන බව,පිරිමැසුම් බව,පූර්ණ බව ආදී වශයෙන් හොඳ තොරතුරක ගුණාංග කීපයකි.

මූලාශ්‍රය අනුව,ස්වභාවය අනුව,කළමනාකරණ මට්ටම,කාලය,නියත හා සම්භාවිතාව අනුව,කළමනාකරණ ශ්‍රිතය සමූහගත වීම හා වෙන් කිරීම යන නිර්ණායක පදනම් කොට ගෙන තොරතුරු ආකාර කීපයකට වර්ග කළ හැකිය.

පහත දැක්වෙන එක් එක් ආයතනයට අදාළව පහත සඳහන් ශීර්ෂ ඔස්සේ පිළිතුරු සපයන්න.

- වෙළෙඳ ආයතනයක සතියක් තුළ ලැබුණු ගැනුම් ඉන්වොයිසි
- ඇඟලුම් කම්හලක සේවකයන්ගේ මාසයනට අදාළ පැමිණීමේ ලේඛන
- පාසලක පන්තියේ සිසුන්ගේ පැමිණීමේ ලේඛන

1.එක් එක් ආයතනයට අදාළ ලේඛනවල තිබිය හැකි දත්ත ලැයිස්තු වෙන වෙනම පිළියෙල කරන්න.
2.එම දත්ත,සැකසුම් ක්‍රියාවලියෙන් තොරතුරු බිහිවන ආකාරය දක්වන්න.
3.එම තොරතුරුවල දැකිය හැකි ගුණාංග සඳහන් කරන්න.
4.ඔබ නිර්මාණය කළ තොරතුරු හා දත්ත අතර වෙනස්කම් ඉදිරිපත් කරන්න.
5.එම තොරතුරු,නිර්ණායක පදනමින් කුමන තොරතුරු වර්ගීකරණයට අයත් දැයි පෙන්වා දෙන්න.

එස්.බන්දුමතී මිය,
ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය.